- **පරිගණකයේ ආරම්භයට අදාළ නිවැරදි පියවර**
    1) පළමුව UPS හිකේබලය බිත්තියෙහි පේනුවට සම්බන්ධ කරන්න.
    2) බිත්තියෙහි පේනු ස්විචය සක්‍රීය කරන්න.
    3) UPSහි විදුලි සැපයුම් බොත්තම ඔබන්න.
    4) පරිගණකයේ විදුලි සැපයුම් බොත්තම ඔබන්න.

- **පරිගණකයේ නිමාවට අදාළ නිවැරදි පියවර**
    1) පරිගණකය නිමා කිරීම සඳහා සියලු මෘදුකාංග වැඩසටහන් වසා දමන්න.
    2) ඔබගේ තිරයේ පහළ වම් කෙළවරේ 'වින්ඩෝස්(Windows)' බොත්තම ඔබන්න.
    3) ඔබගේ තිරයේ දකුණු ඉහළ කෙළවරේ ඇති ´power option` අයිකනය මත ක්ලික් කරන්න.
    4) එවිට ලැබෙන ලැයිස්තුවෙන් ´Shut Down` යන්න තෝරන්න.




- **පරිගණකය භාවිතයේ ආචාරධර්ම**
    - **පරිගණකය භාවිතයේ ආචාරධර්ම යනු කුමක් ද?**
      පරිගණකය භාවිතයේ ආචාරධර්ම යනු කණ්ඩායමක හෝ පුද්ගලයෙකුගේ හැසිරීම පාලනය කරන සදාචාරාත්මක මූලධර්මය. එබැවින් පරිගණක ආචාරධර්ම යනු පරිගණක භාවිතය නියාමනය කරන සදාචාරාත්මක මූලධර්ම වේ.



    - **පරිගණක පරිශීලකයන් සඳහා සදාචාරාත්මක නීති**
        1. වෙනත් පරිශීලකයන්ට හානි කිරීමට පරිගණක භාවිත නොකරන්න.
        2. අනෙක් පරිශීලකයන්ගේ තොරතුරු සොරකම් කිරීමට පරිගණක භාවිත නොකරන්න.
        3. අයිතිකරුගේ අවසරයකින් තොරව ඔවුන්ගේ ගොනු වෙත ප්‍රවේශ නොවන්න.
        4. කර්තෘගේ අවසරයකින් තොරව හිමිකම් සහිත මෘදුකාංග පිටපත් නොකරන්න.
        5. ප්‍රකාශන හිමිකම් නීති සහ ප්‍රතිපත්තිවලට සැම විට ම ගරු කරන්න.
        6. අනෙක් අයගෙන් ඔබ බලාපොරොත්තු වන ආකාරයට අන් අයගේ පෞද්ගලිකත්වයට ගරු කරන්න.
        7. අනෙක් පරිශීලකයන්ගේ අවසරයකින් තොරව ඔවුන්ගේ පරිගණක සම්පත් භාවිත නොකරන්න.
        8. අන්තර්ජාලය සදාචාරාත්මකව භාවිත කරන්න.
        9. නීති විරෝධි සන්නිවේදනය හා ක්‍රියාකාරකම් පිළිබඳ පැමිණිලි කරන්න.
        10. පරිශීලක නාමය සහ මුරපද ආරක්ෂා කිරීම සඳහා පරිශීලකයන් වගබලා ගත යුතු ය. ඒවා මතක තබා ගැනීම සඳහා කඩදාසියක හෝ වෙනත් තැනක ලියා නොතබන්න.
        11. අනෙක් පුද්ගලයන්ගේ මුරපද, ගොනු වැනි ආදිය හිතා මතා ම ලබාගැනීම හෝ ඒවා වෙනස් කිරීම සඳහා පරිගණක භාවිත නොකරන්න.

- **සෞඛ්‍ය ගැටලු අවම කර ගැනීම සඳහා නිවැරදි ඉරියව් භාවිතය**



**රූපය 2.2.1 - නිතිපතා භාවිත කිරීම සඳහා නිර්දේශිත නිවැරදි ඉරියව්**

  - පරිගණක තිරය තමාගේ ඇස් මට්ටමේ හෝ ඊට වඩා මඳක් පහතින් හෝ පිහිටන සේ තබා ගැනීම
  - පරිගණක තිරය හා ඇස් අතර පරතරය අඟල් 18-28 පමණ වීම
  - උරහිස් ලිහිල්ව දෙපසට විහිදෙන සේ පුටුවේ පිටුපස ආධාරක කෙළවරේ කෙළින් ම තබා ගැනීම
  - පාද පොළොව ස්පර්ශවන සේ සැහැල්ලුවෙන් තබා ගැනීම
  - මූසිකය හා යතුරුපුවරුව ආසන්නයේ තබා ගැනීම. අතෙහි ඉහළ බාහුව සහ පහළ බාහුව අතර කෝණය $90^0$ වනසේ අත් සැහැල්ලුවෙන් තබාගැනීම

- **ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය**

  තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ භාවිත වන 3R සංකල්පය අප ඉවත ලන ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ප්‍රමාණය කප්පාදු කිරීමට උදව් වේ.

  - භාවිතය අඩු කිරීම (Reduce) - කැඩුණු උපකරණ අලුත්වැඩියා කිරීම මඟින් අනවශ්‍ය ආකාරයෙන් නව මිල දී ගැනීම් අඩු කර ගැනීම
  - නැවත ප්‍රයෝජනයට ගැනීම (Reuse) - අනවශ්‍ය විද්‍යුත් උපකරණ විනාශ නොකොට ඒවා විකිණීම හෝ පරිත්‍යාග කිරීම
  - ප්‍රතිචක්‍රීකරණය (Recycle) - අලුත්වැඩියා කළ නොහැකි උපකරණ ප්‍රතිචක්‍රීකරණය කරනු ලබන ආයතනයක් වෙත යොමු කිරීම

- **අනවසර පිවිසීම් වැළැක්වීම සඳහා රහස් පද භාවිත කිරීම**

  - පරිගණකයක ගබඩා කර ඇති දත්ත ආරක්ෂා කිරීමට මුරපද යොදා ගැනේ.
  - මුරපද පරිගණකයක් අනවසර පිවිසීම්වලින් හා භාවිත කිරීම්වලින්ආරක්ෂා කරයි.
  - පෙරනිමි මුරපද භාවිත නොකරන්න. "password", "root", "admin," වැනි පෙරනිමි මුරපද භාවිතයෙන් මෙන් ම මුරපද භාවිත නොකිරීම මඟින් අනෙක් අයට පහසුවෙන් ඔබේ පරිගණකයකට ප්‍රවේශ විය හැකි වේ.
  - අකුරු, ඉලක්කම් හා විශේෂ සංකේත මිශ්‍ර කිරීම මඟින් වඩාත් ශක්තිමත් මුරපදයක් නිර්මාණය කර ගැනීම වඩාත් යෝග්‍ය වේ.
  - මුරපද නිතර වෙනස් කරන්න.
  - මුරපද සටහන් කරන ලද කොළ පරිගණකය අසළ නොතබන්න.